# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2128/18 - 2019 ජුනි මස 19 වැනි බදාදා - 2019.06.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය*: AO/MN/02/07/2013.
*ඉඩම් අමාත්‍යාංශ අංකය*: 4/3/4/2012/D/300.

ආරක්ෂක කටයුත්තක් සඳහා පහත දැක්වෙන ඉඩම/පරවශතාව අත්පත් කර ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවින්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ /පරවශතාවයේ විස්තරය:*

උතුරු පළාතේ, මන්නාරම දිස්ත්‍රික්කයේ, මන්නාරම නගරය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 57 ජේසාලේ උතුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, අංක 04 ජේසාලේ ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද පිඹුරු අංක "මන් 744'' හි කැබලි අංක 1, 2, 3, සහ 4 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 1.5064 ක් වූ, වඩලිකුඩල් යනුවෙන් හඳුන්වන පහත විස්තර සඳහන් ඉඩම් කොටස.

මූලික පිඹුරු අංක මන් 744

**කැබලි අංක 1, 2, 3, 4**

ඉඩමේ නම: වඩලිකුඩල්; වර්තමාන ඉඩම පරිහරණය: තල් ඉඩම; හිමිකම් පාන්නා: සෙබමාලෙයි තෝමස් සෙල්වම් කෲස් සහ සවරියන් පතිනාදන් කුලාස්; මුල් හිමිකම් පාන්නා: සෙබමාලෙයි තෝමස් සෙල්වම් කෲස් සහ සවරියන් පතිනාදන් කුලාස්;ප්‍රමාණය: හෙක්. 1.5064.

හිමිකම් පරීක්ෂණ පවත්වන දිනය සහ ස්ථානය:

ඉහත සඳහන් ඉඩම/පරවශතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් 2019 ජූලි මස 23 වැනි දින පෙ. ව. 10.00 ට මන්නාරම නගරය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2019 ජූලි මස 30 වන දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල් හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දනුම් දිය යුතුය.

කේ. සිවසම්පු,
ප්‍රාදේශීය ලේකම්,
මන්නාරම නගරය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය,
මන්නාරම.

2019 ජුනි මස 14 වැනි දින,
මන්නාරම නගරය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07 - 57

## ශුද්ධි පත්‍රිකාව

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

*මගේ අංකය:ඩීඅයිවීඅයිබී/එල්එන්ඩී/එල්ඒඩීඒකිව්/සීඊපී/05/2015/10.*
*ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ යොමු අංකය: 4-3/7/2016/එච්ඩබ්ලිව්/420.*

අංක 2114/68 හා 2019.03.15 දින ශ්‍රී ලංකා ප්‍රජාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, සිංහල භාෂා මාධ්‍ය අතිවිශේෂ ගැසට් පත්‍රයේ III වන කොටසෙහි අවසාන ගම් පිඹුරු අංක 1170, අතිරේක අංක 13 හා පත්‍ර අංක 15 හි කැබලි පරාසය වැරදීමකින් 635 සිට 645 ලෙස සඳහන් වී ඇති අතර,එය 635 සිට 647 ලෙස නිවැරදි කිරීම.

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/ පරවශතාව ලබා ගැනීමට රජය අදහස් කරන බැවි,1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තරය :*

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඉහල විසිදෙකේ කෝරළේ බටහිර සුළු කොට්ඨාසයේ, අංක 512, කිරිදිගල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, කිරිදිගල්ල ගමේ පිහිටි, සර්වේයර් ජනරාල්ගේ අවසාන ගම් පිඹුරු අංක 1170, අතිරේක අංක 13, පත්‍ර අංක 15 හා 2018.09.07 දිනැති පිඹුරේ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 2.2508 ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබලි 635 සිට 647 (කැබලි 13) ට මායිම්;

එම්.ඒ.එස්.මාරසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
ඉබ්බාගමුව.

ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07 - 58

## ශුද්ධි පත්‍රිකාව

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

*මගේ අංකය:ඩීඅයිවීඅයිබී/එල්එන්ඩී/එල්ඒඩීඒකිව්/සීඊපී/05/2015/05-* වෙළුම III.
*ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ යොමු අංකය: 4-3/7/2016/එච්ඩබ්ලිව්/259.*

අංක 2084/14 හා 2018.08.14 දින ශ්‍රී ලංකා ප්‍රජාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* III කොටසෙහි අවසාන ගම් පිඹුරු අංක 2806, අතිරේක අංක 6 හා පත්‍ර අංක 9 හි අංක 412 දියතුරේ ලෙස සඳහන් ග්‍රාම නිලධාරී වසම සංශෝධිත අවසාන ගම් පිඹුරෙන් පසුව අංක 414 පන්ලියද්ද, අංක 413 නාබැට ලෙස සංශෝධනය විය යුතු ය.

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/ පරවශතාව ලබා ගැනීමට රජය අදහස් කරන බැවි,1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තරය :*

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඉහළ ඕතොට කෝරළේ සුළු කොට්ඨාසයේ, අංක 414 පන්ලියද්ද, අංක 413 නාබැට ග්‍රාම නිලධාරී වසම්වල, හැවනතැන්න ගමෙහි පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක අ.ග.පි. 2806 හා 2017.12.29 දිනැති අතිරේක අංක 6, පත්‍ර අංක 9හි කැබලි අංක 168 - 293 (කැබලි 109ක්) වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 8.1166 පමණ වූ පහත විස්තර සඳහන් ඉඩම් කැබලි.

එම්.ඒ.එස්.මාරසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
ඉබ්බාගමුව.

ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07 - 59

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.